ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන - 4 වන මට්ටම

**2022/2023 අවසාන පරීක්ෂණය**

**EPU4236 - මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනයේ වෘත්තීය ගුරුභූමිකාව.**

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2024.03.09 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

<u>1 වන කොටස</u>

01. "ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලාව ප්‍රධාන අවධි 3 ක් සහ අංග 3 කින් සමන්විත වේ." එම අංග 3 ලැයිස්තු ගතකර ඒවා ප්‍රධාන අවධි 1 සිට 3 දක්වා වෙනස්වන අයුරු රූපසටහනක් මඟින් පැහැදිලි කරන්න.

02. (a) බ්ලූම්ස්ගේ (Bloom's) වර්ගීකරණය කෙටියෙන් පැහැදිලි කරන්න.

    (b) පහළ මට්ටමේ ප්‍රජානන කුසලතා සහ ඉහළ මට්ටමේ ප්‍රජානන කුසලතා වෙන් වෙන් වශයෙන් ලැයිස්තු ගත කරන්න.

03. "ශිෂ්‍යයාගේ පෙර දැනුම පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට සහ එය නව තොරතුරු සමඟ සම්බන්ධ කිරීමට ගුරුවරයා ඉගෙනුම් ක්‍රියාකාරකම් සංවිධානය කළ යුතුය."

    ප්‍රාථමික පාසල් ගුරුවරයෙක් ලෙස ඔබට ප්‍රාථමික පන්තිකාමරයේ පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ඉහත ප්‍රකාශය අදාල කළ හැක්කේ කෙසේද?

04. සම්බන්ධතාවාදී ( Connectivism ) ප්‍රවේශයට අනුව ගුරුවරයාගේ භූමිකාව පැහැදිලි කරන්න.

05. "තක්සේරුකරණය" යන යෙදුම නිර්වචනය කර එහි වැදගත්කම පැහැදිලි කරන්න.

06. ඉගැන්වීමේ ක්‍රමෝපායන් ලැයිස්තු ගතකර එම එක් එක් ක්‍රමෝපායන් කෙටියෙන් පැහැදිලි කරන්න.

07. සාමාන්‍ය දැනීම - කුසලතා හුවමාරුකර ගැනීම යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

08. සාර්ථක ඉගෙනීම් ක්‍රියාවලියක් සඳහා ප්‍රාථමික පාසල් ගුරුවරියෙක් ලෙස ඔබ ඔබගේ සිසුන්ට පෙළඹවීම කරන්නේ කෙසේද?

(ලකුණු 5 x 8=40)

## 02- කොටස

09. "ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන ක්‍රමය තුළ ප්‍රධාන නිපුණතා වර්ග 2 ක් හඳුනාගත හැකි වේ."

(i.) එම නිපුණතා වර්ග 2 නම්කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 06)

(ii.) "සම්භවන තක්සේරුකරණය සහ සම්පිණ්ඩිත තක්සේරු කරණය" යන යෙදුම් නිර්වචනය කරන්න. (ලකුණු - 06)

(iii.) "නිර්නායක මූලික තක්සේරුවට වඩා ප්‍රතිමාන මූලික තක්සේරුව වඩා සුදුසුය." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ ද? ඔබගේ පිළිතුර සාධාරණීකරනය කරන්න. (ලකුණු - 08)

10. (i.) ඉගෙනුම් පරිසරය යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු - 05)

(ii.) පෙර පාසල් සහ ප්‍රාථමික පාසල් ළමුන්ට ධනාත්මක ඉගෙනුම් පරිසරයක් ලබාදීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු - 05)

(iii.) පෙර පාසලකට හෝ ප්‍රාථමික පාසලකට අදාලව උත්තේජනාත්මක පන්තිකාමරයක් සැලසුම් කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු - 10)

11. (i.) ඉගැන්වීමේ වෘත්තීකරණය යන යෙදුමෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු - 05)

(ii.) ඉගැන්වීමේ වෘත්තීයකරණයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු - 07)

(iii.) ඔබට ඵලදායි ප්‍රාථමික පාසල් ගුරුවරියකු විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු - 08)

12. "Buchberger (2000)" සඳහන් කරන පරිදි ගුරුවරයා ප්‍රධාන භූමිකා 4 ක් නිරූපනය කළ යුතුය.

(i.) ඒම ප්‍රධාන **භූමිකා 4** ලැයිස්තු ගතකර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 08)

(ii.) වර්තමාන ශ්‍රී ලාංකික ප්‍රාථමික පාසල් ගුරුවරුන්ගේ තත්ත්වය විශ්ලේෂණය කරන්න. (ලකුණු - 12)

13. (i.) පහත යෙදුම් නිර්වචනය කරන්න.

(a) ගුරු - කේන්ද්‍රීය අධ්‍යාපනය
(b) ඉගෙනුම්කරු (සිසු) - කේන්ද්‍රීය අධ්‍යාපනය. (ලකුණු - 08)

(ii.) "ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයේ සිට ඉගෙනුම්කරු (සිසු) කේන්ද්‍රීය අධ්‍යාපනයට සංක්‍රමණය වීම අත්‍යවශ්‍ය වේ."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? ඔබගේ පිළිතුර අදාල උදාහරණ සමඟ සාධාරණීකරණය කරන්න. (ලකුණු - 12)

- හිමිකම් ඇවිරිණි. -